# සන්ක්‍රමණිකයන් සඳහා සෞඛ්‍ය අයිතිවාසිකම් ලබා ගැනීම සඳහා ප්‍රායෝගික මාර්ගෝපදේශය

1. ජාතික සෞඛ්‍ය සේවයෙන් (SSN) සහතික කරන ලද සේවාවන්
2. නැවතීමේ අවසර පත්‍රයක් ඇති විදේශිකයින් සඳහා සෞඛ්‍ය අයිතිවාසිකම්
   - SSN හි අනිවාර්ය ලියාපදිංචියට අයිතිය ඇති, නැවතීමේ අවසර අවසරපත්‍රය ඇති විදේශිකයන් සඳහා.
   - තම පවුලෙන් යැපෙන පවුල් සාමාජිකයින් සඳහා
   - පළමු වරට නැවතීමේ අවසරපත්‍රය ලබා ගැනීමට බලාපොරොත්තු වන විදේශිකයන් සඳහා.
   - නැවතීමේ අවසරපත්‍රය අලුත් කිරීමට බලාපොරොත්තු වන විදේශිකයන් සඳහා.
   - SSN හි ස්වේච්ඡා ලියාපදිංචියට අයිතිය ඇති නැවතීමේ අවසරපත්‍රයක් ඇති විදේශිකයන් සඳහා
   - සංචාරක හෝ ව්‍යාපාරික අරමුණු සඳහා ඉතාලියෙහි නේවාසික වන විදේශිකයන් සඳහා
   - වෛද්‍ය ප්‍රතිකාර සඳහා නේවාසික අවසරපත්‍රයක් ඇති විදේශිකයන් සඳහා
   - අභාධිත තත්ත්වයන් සහිත විදේශිකයන් සඳහා
   - ඉතාලි පුරවැසියෙකුගේ විදේශික ස්වාමිපුරුශයා හෝ බිරිද සඳහා
3. නේවාසික අවසරපත්‍රයකින් තොර විදේශිකයින්ගේ සෞඛ්‍ය අයිතිවාසිකම්
   - STP (නියමිත තාවකාලික රෝගීන්) සඳහා සෞඛ්‍ය සේවාව
   - තාවකාලික සෞඛ්‍ය කාඩ්පත නිකුත් කිරීම සහ යාවත්කාලීන කිරීම
4. දේශපාලන රැකවරණ (Asilo Politico)
   - පොලිස් දෙපාර්තමේන්තුව (Questura) වෙතින් ලැබුණු අයදුම් පත්‍ර රිසිට්පතක් ඇති අය සඳහා
   - දේශපාලන රැකවරණ සඳහා අයදුම්පත්‍රය සඳහා අවසරපත්‍රයක් ඇති අය සඳහා
   - අවසරපත්‍රය ප්‍රතික්ෂේප වූ නමුත් නියමිත නඩු විමර්ශන පත්‍ර අන්කයක් ඇති අය සඳහා
   - දේශපාලන රැකවරණ , උපසහාය ආරක්ෂාව හෝ විශේෂ ආරක්ෂාව සඳහා අවසරපත්‍රයක් ඇති අය සඳහා
5. සන්ක්‍රමණික කාන්තාවන්ගේ සෞඛ්‍යය හා මාතෘකාළය
   - ගැබිනියන් හෝ ප්‍රසවයෙන් පසු කාන්තාවන් සඳහා නැවතීමේ අවසරපත්‍රය
   - නේවාසික අවසරපත්‍රයකින් තොර ගැබිනි කාන්තාවන්
6. සන්ක්‍රමණික ළමයාගේ සෞඛ්‍යය
   - නේවාසික අවසරපත්‍රයක් ඇති විදේශික දෙමාපියන්ගෙන් ඉතාලියෙහි උපන් දරුවන්
   - නේවාසික අවසරපත්‍රයකින් තොර දෙමාපියන්ගෙන් ඉතාලියෙහි උපන් දරුවන්
   - දරුකමට හදා ගන්නා හෝ භාරකාරත්වයට පත් දරුවන් ඇවෑමෙන් දරුකමට හදා ගැනීම සිටින දරුවන්

7. ගාස්තු නිවාරණය (Esenzione Ticket)
8. ආර්ථිකව අසරණ යුරෝපීය සංගම පුරවැසියන්ගේ සෞඛ්‍ය අයිතිවාසිකම්
9. STP සඳහා විශේෂ සෞඛ්‍ය මධ්‍යස්ථාන
10. නාපොලි 1 මධ්‍යම සෞඛ්‍ය දිස්ත්‍රික්කය මගින් අයිතිවාසිකම් (ASL Napoli 1 Centro)
11. රෝහල් සහ හදිසි ප්‍රතිකාර ඒකක (Presidi di Pronto Soccorso)

## 1. ජාතික සෞඛ්‍ය සේවය (SSN) මගින් සහතික කරන ලද සේවාවන්

ජාතික සෞඛ්‍ය පද්ධතියට (SSN) ලියාපදිංචි වී ඇති සන්කරමණිකයන්, ඉතාලි පුරවැසියන්ට මෙන්ම, මූලික වෛද්‍යවරයෙකු (ඇතැම් විට, වයස අවුරුදු 14 ට අඩු ළමයින් සඳහා ළමා විශේෂඥ වෛද්‍යවරයෙකු) විසින් සෞඛ්‍ය සේවා ලබා දේ. ලියාපදිංචි වීමේදී සහ සෞඛ්‍ය කාඩ්පත (tessera sanitaria) ලබා ගන්නාවිට, ලැබෙන වෛද්‍යවරුන්ගේ හා ළමා විශේෂඥ වෛද්‍යවරුන්ගේ ලැයිස්තුවකින් තමන් කැමති වෛද්‍යවරයෙක් තෝරා ගත යුතුය.
SSN හි ලියාපදිංචි වීමට ඇති අයිතිය නේවාසික අවසරපත්‍රයේ වලන්ගු කාලසීමාවට සමාන වේ, එමෙන්ම එය අවුරුදු 18ට අඩු දරුවන් හා අනෙකුත් යැපෙන ලබන පවුලේ සාමාජිකයින්වද ආවරණය කරයි.

මූලික වෛද්‍යවරයාගේ කාර්යභාරය : ඔහු/ඇය සෞඛ්‍ය සම්බන්ධ ගැටළු සඳහා ප්‍රධාන සම්බන්ධතා මූලාශ්‍රය වේ. වෛද්‍යවරයා තම සේවා දිනයන් සහ කාලසටහන රෝගියාට දැනුම් දිය යුතුය.

අදාළ කාලයන් තුළ වෛද්‍යවරයා:

- රෝගියා සිය වෛද්‍ය මධ්‍යස්ථානයේදී හෝ අවශ්‍ය නම් රෝගියාගේ ගෘහයේදී පරීක්ෂා කරයි;
- ඖෂධ, විශේෂඥ පරීක්ෂණ, නිරූපණ පරීක්ෂණ සහ රෝහල් ගත කිරීම් සඳහා උපදෙස් ලබා දෙයි. විශේෂඥ පරීක්ෂණ සහ රෝග හඳුනා ගැනීමේ පරීක්ෂණ.

මූලික වෛද්‍යවරයා විසින් නිර්දේශ කළ විශේෂඥ හෝ රෝග හඳුනා ගැනීමේ පරීක්ෂණ කිරීමට, රෝගියා CUP (Centro Unico di Prenotazione) හෝ අනෙකුත් සම්මත වූ මධ්‍යස්ථානයක් හරහා දින වෙන්කර ගැනීමක් කළ යුතුය. අදාළ සහණයක් නොමැති නම්, රෝගියා "ටිකට්" ලෙස හැඳින්වෙන පිරිවැය වියදම් කොටසක් ගෙවිය යුතුය.

තාවකාලිකව වෙනත් නගරයක සිටින රෝගීන්: SSN හි ලියාපදිංචි වූ ඉතාලි හෝ විදේශික පුරවැසියෙකු තාවකාලිකව තම නගරයෙන් පිටත සිටින විට, ඔහුටද සවුකය සේවාවන් ලබා ගැනීමේ අයිතිය පවතී. නමුත්, එම නගරයේ මූලික වෛද්‍යවරයාට ගෙවිය යුතු පරීක්ෂා කිරීමේ ගාස්තුව රෝගියා විසින්ම ගෙවිය යුතුය.

ඉක්මන් සෞඛ්‍ය ගැටළු සඳහා සේවාවන්: මූලික වෛද්‍යවරයා සේවය නොකරන කාලයන්හිදී, හදිසි සෞඛ්‍ය ගැටලුවක් ඇති විට, රෝගියාට ජාතික සෞඛ්‍ය දිස්ත්‍රික්කයේ “Guardia Medica” (ආරක්ෂාකාරී වෛද්‍ය සේවාව) ඇමතිය හැක. ඇමතිය හැකි කාලසීමා මෙසේය:

- ➔ සියලු දින: රාත්‍රී 20.00 සිට පසු දින උදේ 8.00 දක්වා
- ➔ සෙනසුරාදා සහ ඉරිදා නිවාඩු දින: උදේ 10.00 සිට රාත්‍රී 20.00 දක්වා
- ➔ රතු නිවාඩු දිනට පෙර දින : උදේ 08.00 සිට රාත්‍රී 20.00 දක්වා.

මෙම සේවාව නොමිළයේ (ගාස්තු රහිත) වේ, නමුත් මෙහිදී සාමාන්‍ය පරීක්ෂණ හෝ නිරූපණ පත්‍රිකා ලබා නොදේ.

ඉතා හදිසි සවෘ්‍යකය අවස්ථාවන්හි (Emergenze Sanitarie) :

- බරපතල තත්ත්වයක සිටින, ගෙනයාමට නොහැකි පුද්ගලයෙකු සඳහා, 118 අංකයට අමතා ඉක්මන් ගිලන් රථ සේවාවක් (ambulanza) ඉල්ලා සිටිය හැක. මෙය සම්පූර්ණයෙන්ම නිදහස් සේවාවක් වන අතර පැය 24 ම ක් පුරාවට ක්‍රියාත්මක වේ.
- වෙනත් විකල්පයක් ලෙස, රෝගියාව ආසන්නම රෝහලේ Pronto Soccorso (ඉක්මන් ප්‍රතිකාර ඒකකය) වෙත රෝගියාව රැගෙන යාමට හැක.



## 2. නැවතීමේ බළපත්‍ර හිමි විදේශිකයනට හිමි සවුකය අයිතිවාසිකම්

| තත්ත්වය | අයිතිවාසිකම් | අවශ්‍යදේ |
|---|---|---|
| නේවාසික අවසරපත්‍රයක් හිමි විදේශිකයින්ගේ සෞඛ්‍ය අයිතිවාසිකම් නේවාසික අවසරපත්‍රයක් හිමි (Permesso di soggiorno) විදේශිකයින්හට අදාළ අයිතිවාසිකම්: රැකියාව සඳහා නේවාසික අවසරපත්‍රය ඇති අය, පවුල් හේතු සඳහා නිවාස අවසරපත්‍රයක් ඇති අය, දේශපාලන රැකවරණ (Asilo politico) හිමි අය සහ ඉල්ලා සිටින්නන් , මානුශික හේතු නිසා ලැබුණු නේවාසික අවසරපත්‍රය හිමි අය (Asilo umanitario), ඉතාලි පුරවැසිභාවය ලබාගැනීමේ ක්‍රියාවලියෙහි යෙදෙන අය, දිගු කාලීන CE නේවාසික අවසරපත්‍රයක් ඇති අය. (Permesso di soggiorno CE di lungo periodo).<br><br>වැදගත් :<br><br>ඔබ යුරෝපීය සංගමයෙන් පිටත රටක පුරවැසියෙකු (cittadino extracomunitario) නම්, ඔබට නේවාසික අවසරපත්‍රය (permesso di soggiorno) තිබේ නම්, ඔබ නේවාසික ලියාපදිංචිය (Anagrafe del Comune) හි ලියාපදිංචි විය යුතුය. ඒ සඳහා ඔබගේ නගරයේ (quartiere) ලියාපදින්චි Ufficio Anagrafe වෙත ගොස්, ඉතාලි පුරවැසියන්ට අවශ්‍ය සාමාන්‍ය ලේඛනවලට අමතරව, ඔබගේ නේවාසික අවසරපත්‍රය සහ ඔබේ ගමන් බලපත්‍රය ඉදිරිපත් කළ යුතුය. ලියාපදින්චි කාර්යාලයේ Anagrafe හි ලියාපදිංචි වීම අත්‍යවශ්‍යයි, මන්ද එය රැඳී සිටීමේ ලියාපදිංචිය (residenza) සහ අනෙකුත් ලේඛන ලබා ගැනීම සඳහා අවශ්‍ය වේ<br><br>උදාහරණ ලෙස: හැඳුනුම්පත්, පවුල් සාමාජික සහතිකය (Stato di famiglia),<br><br>ඉතිහාසික නාගරික නේවාසික සහතිකය (Certificato di residenza storica). ඔබට අවුරුදු පහකට වැඩි ඉතාලියේ නාගරික නේවාසික සහතික පත්‍ර "residenza storica" ලේඛනයක් තිබේ නම්, ඔබට වැඩි පහසුවෙන් දිගු කාලීන CE නවාස අවසරපත්‍රය (Permesso di soggiorno CE di lungo periodo) (පැරණි නේවාසික කාඩ්පත, ex carta di soggiorno ලෙස හැඳින්වෙයි) ලබා ගැනීමට හැකියාව ඇත. | අවශ්‍ය ලේඛන : ඔබට ජාතික සෞඛ්‍ය පද්ධතියට (Servizio Sanitario Nazionale – SSN) අනිවාර්ය ලෙස, නොමිලේ ලියාපදිංචි වීමේ අයිතිය ඇත.<br><br>ඔබට ඉතාලි පුරවැසියෙකු මෙන්ම සම අයිතිවාසිකම් සහ වගකීම් හිමිවේ. මෙම ලියාපදිංචි වීමේ අයිතිය ඔබගේ නේවාසික අවසරපත්‍රයේ කල්පිරීමේ දිනය දක්වාවලංගු වන අතර,<br><br>එය ඔබගේ නේවාසික පවුල් සාමාජිකයින්ටද අදාළ වේ. කම්පානියා ප්‍රාන්තය (Regione Campania) විසින්, 2024 මාර්තු 20 දින නිකුත් කළ සටහන නම: PG/2024/0146228 (විදේශික පුරවැසියන්ගේ SSN ලියාපදිංචි ලංගුකාලය පිළිබඳ), 2018 ජූනි 11 දින නිකුත් කළ චක්‍රලේඛණ අංක 372901 යටතේ සංශෝධන හා එකතු කිරීම් සිදු කළේය. මෙම නව නියමයන් අනුව, කම්පානියා ප්‍රාන්තයේ නේවාසික අවසරපත්‍රයක් (Permesso di soggiorno) ඇති යුරෝපීය සංගමයට අයත් නොවන පුරවැසියන්ට, TEAM (Tessera Europea di Assicurazione Malattia) යුරෝපීය සෞඛ්‍ය වගකීම් කාඩ්පත නේවාසික අවසරපත්‍රයේ කාලයත් සමඟ සමාන කාලයකට නිකුත් කිරීමට නියම කර ඇත. | ජාතික සෞඛ්‍ය පද්ධතියට (SSN) ලියාපදිංචි වීමට අවශ්‍ය දේවල්:<br><br>ඔබගේ නේවාසික දිස්ත්‍රික්කයේ (ufficio anagrafe distretto di residenza) ලියාපදින්චි කාර්යාලයට පහත ලේඛන ඉදිරිපත් කළ යුතුය:<br>• හැඳුනුම් ලේඛනයක් (Documento di riconoscimento)<br>• බදු අන්ක කේතය (Codice fiscale) දිවුරුම් ප්‍රකාශයක් මගින් ඉදිරිපත් කළ හැක (autocertificabile)<br>• නේවාසික අවසරපත්‍රය (Permesso di soggiorno) එයට අදාළ නේවාසික හේතුව දිවුරුම් ප්‍රකාශයක් මගින් ඉදිරිපත් කළ හැක නේවාසික අවසරපත්‍ර ඉලොක්ට්‍රොනික කාඩ්පත (Permesso di soggiorno elettronico) , හිමියන් සඳහා හෝ පොලීසිය විසින් නිකුත් කළ සහතිකයක් (certificazione della Questura) එක් කළ යුතුය<br>• නේවාසික ලියාපදිංචිය (Residenza) — දිවුරුම් ප්‍රකාශයක් මගින් ඉදිරිපත් කළ හැක හෝ, නේවාසික ලියාපදිංචිය බලාපොරොත්තු වන්නේ නම්, නේවාසික අවසරපත්‍රයේ සඳහන් වාසස්ථානය (Domicilio) ද සඳහන් කළ යුතුය — ඒද දිවුරුම් ප්‍රකාශයක් මගින් ඉදිරිපත් කළ හැක. |

## ජාතික සෞඛ්‍ය පද්ධතියට (SSN) අනිවාර්ය ලියාපදිංචිය කළ විදේශිකයින්ගෙන් යැපෙන ලබන පවුල් සාමාජිකයින් අනිවාර්ය SSN

ලියාපදිංචියක් ඇති විදේශිකයින්ගෙන් යැපෙන ලබන පවුල් සාමාජිකයන් අතරට, වයස අවුරුදු 18 ඉක්මවූ පුද්ගලයන් ද ඇතුළත් වේ, එහෙත් ඔවුන්ට ස්වයං නේවාසික අවසර පත්‍රයක් තිබුණද, INPS (Istituto Nazionale della Previdenza Sociale) මගින් නිර්ණය කරන ලද ප්‍රමිති අනුව, පවුල් ආධාර (assegni familiari) ලබා ගැනීමේ අයිතිය ඇති අය ලෙස සැලකේ. (ඒ ආධාරය ප්‍රායෝගිකව ලබා නොගන්නා නමුත්, නීතිමය අයිතිය ඔවුන්ට පවතී).

(ජාතික සෞඛ්‍ය පද්ධතියට) අනිවාර්ය ලියාපදිංචි වීමේ අයිතිය ඇති නේවාසික අවසරපත්‍රයක් ඇති විදේශිකයකුගේ ගෙන් යැපෙනා ලබන පවුල් සාමාජිකයෙකු නම් ඔහුටද SSN (Servizio Sanitario Nazionale) හි අනිවාර්ය ලියාපදිංචිය සඳහා අයිතිය ඇත.

වයස අවුරුදු 65 ඉක්මවන දෙමව්පියන් 2008 නොවැම්බර් 5 අනතුරුව ඉතාලියට ඇතුලුවී පළමු පවුල් නැවත එකතු වීම සිදු වී, (ricongiungimento familiare) නේවාසික අවසරපත්‍රය ලැබූ විට, මෙම අයිතිය අදාළ ඒ අය සඳහා අයත් නොවේ.

- ඉතාලියේ නීතිමය ලෙස නේවාසිකව සිටිය යුතුය, පවුලේ යැපෙන්නන්ගේ ලේඛනය
- සහ පවුල් සාමාජිකයකු බව තහවුරු කරන ලේඛන ඉදිරිපත් කළ යුතුය.



නේවාසික ප්‍රවේශ වීසා (visto di ingresso) ලැබූ විදේශිකයෙකු පළමු නේවාසික අවසරපත්‍රය බලාපොරොත්තු වන වීමෙදී , ඔහු පළමු නේවාසික අවසරපත්‍රය (primo permesso di soggiorno) බලාපොරොත්තු වන අතර , එය ලබාදෙන හේතුව රැකියාව සඳහා (lavoro subordinato) හෝ පවුල් නැවත එකතු වීම සඳහා (ricongiungimento familiare) විය හැක.




රැකියාව හෝ පවුල් නැවත එකතු වීම සඳහා නේවාසික අවසරපත්‍රය නිකුත් වන තෙක්

ඔබට ජාතික සෞඛ්‍ය පද්ධතියට (SSN) අනිවාර්ය ලියාපදිංචිය සඳහා අයිතියක් ඇත. මෙම අයිතිය පළමුව මාස 6 ක කාලයක් සඳහා වලංගු වේ. එම කාලය අවසන් වූ පසු, ඔබට මාස 3 ක කාලය දක්වා දිගු කිරීම (proroga) ලබා ගත හැකි අතර, එය නේවාසික අවසරපත්‍රය නිකුත් කිරීමේ ක්‍රියාවලිය අවසන් වනතෙක් නැවත නැවත දිගු කළ හැක.

ඔබ නේවාසික සෞඛ්‍ය දිස්ත්‍රික්කයේ ජනගණන කාර්යාලයට (Ufficio Anagrafe assistiti) පහත ලේඛන ඉදිරිපත් කළ යුතුය :

- හැඳුනුම්පතක්
- බදු අංකය (Codice fiscale) ස්වයං-සහතික කළ හැක
- නේවාසික අවසරපත්‍රය ඉල්ලා යැවූ බව තහවුරු කරන තැපැල් රිසිට්පත

අමතරව:

රැකියාව සඳහා නේවාසික අවසරපත්‍රයක් සඳහා නම්:

- රැකියා ගිවිසුමක පිටපත
- නේවාසික අවසරපත්‍රය ඉල්ලා සිටින අයදුම් පත්‍රයේ පිටපත

පවුල් නැවත එකතු වීම (ricongiungimento familiare) සඳහා නම්:

- ආගන්තුක වීසා (visto d'ingresso)
- විදේශගතකරණ එක්කබද්ධ කාර්‍යාලෙයෙන් (Sportello Unico Immigrazione) නිකුත් කළ "nulla osta" (අවසර ලිපියක්) පිටපත.

## 2. නේවාසික බළපත්‍රය හිමි විදේශිකයන්ගේ සවුඛ්‍ය අයිතිවාසිකම්

| තත්ත්වය | අයිතිවාසිකම් | අවශ්‍යදේ |
|---|---|---|
| නැවතීමේ බළපත්‍රය අලුත් කිරීමට සිටින විදේශිකයන් | ඔබේ නේවාසික අවසර පත අලුත් කිරීමේ ක්‍රියාවලිය (pratica) අවසන් වන තෙක්, ඔබට ජාතික සෞඛ්‍ය පද්ධතිය (SSN) හි ලියාපදිංචිය දිගු කරවා ගැනීමට (proroga) අයිතියක් ඇත. මෙම දිගුව පොලිස් කාර්යාලයේ (Questura) ඔබට ලැබුණු නියමිත දිනය (appuntamento) දක්වා වලංගු වේ , එනම් උපරිම වසර 1ක් දක්වා වේ. එමගින් පසු, ඔබට තවත් ප්‍රතිවර්ධන කාළයක් (proroghe), එම එක් එක් දිගුව උපරිම මාස 6ක් දක්වා වලංගු වන පරිදි, ලබා ගත හැක. ඔබගේ සෞඛ්‍ය කාඩ්පත (Tessera Sanitaria) කල් ඉකුත් වී ඇති අතර, ඔබ නවීකරණයක් (rinnovo) බලාපොරොත්තු නොවන්නේ නම්, ඔබට එම සෞඛ්‍ය සේවා අයිතිය අහිමි වේ. | ඔබ නේවාසික වන දිස්ත්‍රික්කයේ ජනගණන කාර්යාලයට (Ufficio Anagrafe del Distretto) පහත ලේඛන ඉදිරිපත් කළ යුතුය:<br>• නේවාසික අවසරපත්‍රය (Permesso di soggiorno) අලුත් කිරීම සඳහා ඉල්ලීම කළ බවට තැපැල් රිසිට් පත – මුල් පිටපත සහ පිටපත (fotocopia)<br>• කල් ඉකුත් වූ නේවාසික අවසරපත්‍රය<br>• හැඳුනුම්පතක් (Documento di riconoscimento) |
| ජාතික සෞඛ්‍ය පද්ධතියට (SSN) ස්වේච්ඡා ලියාපදිංචියට අයිතිය ඇති නේවාසික අවසරපත්‍රය ඇති විදේශිකයෙකු<br><br>පහත හේතු මත නේවාසික අවසරපත්‍රය (Permesso di soggiorno) හිමි විදේශිකයන්ට SSN වෙත ස්වේච්ඡා ලියාපදිංචියට හැකියාව ඇත.<br>• ඉගෙනුම් හේතු සඳහා (motivi di studio)<br>• “alla pari” සේවකයන් ලෙස (නිවසක සේවය/සංරක්ෂණය සඳහා)<br>• ඉතාලියේ අභාදිත පදින්චිය සඳහා (residenza elettiva)<br>• රාජ්‍ය තානාපති හෝ රාජ්‍ය සේවකයින්<br>• ආගමික හේතු සඳහා (රැකියා සම්බන්ධතාවයක් හා අදාළ ආධාර ගෙවීම් පවතින්නේ යයිද | ජාතික සෞඛ්‍ය පද්ධතියට (SSN) ලියාපදිංචිය ස්වෙච්ඡාමය සදහා ගෙවීම් අවශ්‍ය වේ. මෙය ලියාපදිංචි වූ වර්ෂයේ දෙසැම්බර් 31 වන දින දක්වා වලංගු වන අතර, ඒත් සමගම එය නේවාසික අවසරපත්‍රයේ කල් ඉකුත් වන දිනයට වැඩි නොවිය යුතුය. ස්වෙච්ඡා ලියාපදිංචිය සඳහා ගෙවිය යුතු මුදල් (contributi), නේවාසික අවසරපත්‍රයේ වර්ගය, පුද්ගලික තත්ත්වය අනුව වෙනස් වන අතර, එය නියමිත කාලයන්හිදී නැවත විග්‍රහයට (rivisitazione periodica) ලක් කළ හැක. ශිෂ්‍යයන් සහ “alla pari” සේවකයින් ඔවුන්ට තමන්ගෙන් යැපීම ලබන ලබන පවුල් සාමාජිකයින් සඳහාද SSN ස්වෙච්ඡා ලියාපදිංචිය සදහා ලියාපදින්චි කිරීමට අවශ්‍ය නම්, එම අවශ්‍යතාවය සඳහා අමතර වාරිකයක් (contributo aggiuntivo) ගෙවිය යුතුය. | SSN (Servizio Sanitario Nazionale) වෙත ස්වේච්ඡා ලියාපදිංචිය සඳහා ඔබ විසින් ඉදිරිපත් කළ යුතුය:<br>• ඉතාලි පුරවැසියන් සඳහා අවශ්‍ය ලේඛන<br>• Soggiorno අවසර පත්‍රය (permesso di soggiorno)<br>• PagoPA මගින් අදායම් ගෙවීම සිදු කළ බවට සහතිකය<br><br>එමෙන්ම,<br>• soggiorno අවසර පත්‍රය අනුව<br>• අධ්‍යයන හේතු සඳහා (motivi di studio): පාඨමාලා ලේඛන (ලියාපදිංචිය හා කාලසීමාව ඇතුළත්)<br>• “Collocati alla pari” හේතු සඳහා: Alla pari සේවය ඉටු කරන බව සහතික කරන ලේඛන<br>• වෙනත් සියලු කාණ්ඩ සඳහා: පෙර වසරේ ආදායම සහතික කරන ලේඛන<br><br>පවුලේ යැපෙන සාමාජිකයින්ගේ සඳහා SSN ලියාපදිංචිය සඳහා, ඔබ පෙර වසරේ ආදායම් ප්‍රකාශය අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතුය. |

සහ රජයේ සෞඛ්‍ය සේවාව (SSN) වෙත අනිවාර්ය ලියාපදිංචියට අවසරදෙන බව සහතික කරන කුරියා අමාත්‍යාංශයේ මාලිමාවක් පවතින අවස්ථාවෙහි)

- ජාතික සෞඛ්‍ය පද්ධතියට (SSN) ස්වේච්ඡා ලියාපදිංචියට අයිතිය ඇති නේවාසික අවසරපත්‍රයක් ඇති විදේශික සේවයකයෙකු
- විද්‍යාත්මක පර්යේෂණ කරුවන්
- ඉතාලියේ ක්‍රියාත්මක වන ජාත්‍යන්තර සංවිධානවල සේවකයන්
- 2008/11/05 අදි-පසුව පවුල් එකතුකිරීම් මගින් (ricongiungimento familiare) මගින් ඉතාලියට ආ 65 වයස ඉක්මවූ දෙමාපියන්

වැදගත්ය:
ඔබ ඉගෙනුම් හේතු සඳහා නේවාසික අවසරපත්‍රයක් (permesso di soggiorno per motivi di studio) ඇති තරුණයෙකු නම්, ඔබ  බාළවයස්කාර වයස ඉක්මවා (18 හැවිරිදි වූ පසු) පවා, ඔබ පෙර SSN අනිවාර්ය ලියාපදිංචියක් ඇති පවුල් සාමාජිකයෙකුගෙන්  යැපුම්  ලබන සාමාජිකයෙකු ලෙස ලියාපදිංචි වී සිටිය හැක, ඔබට නිකුත් වන අනිවාර්ය නොමිලේ ලියාපදිංචියට (iscrizione obbligatoria gratuita al SSN) අයිතිය තවදුරටත් පවතී.

## 2. නේවාසික බළපත්‍රය හිමි විදේශිකයන්ගේ සවුකය අයිතිවාසිකම්

| තත්ත්වය | අයිතිවා සි කම් | අවශ්‍යදේ |
|---|---|---|
| සන්චාරය සහ ව්‍යාපාර නේවාසික බළපත්‍රය හිමි විදේශිකයන්.<br><br>( වසමේ පොළිස් කාර්‍යාළයට තමන්ගේ සිටිනා බව දැන්වූ ලිපිය සහිතව ) | SSN (ජාතික සෞඛ්‍ය සේවා පද්ධතිය) වෙත ලියාපදිංචිය කළ නොහැක.<br><br>හදිසි අවස්ථා සෞඛ්‍ය සේවා (උදාහරණයක් ලෙස “pronto soccorso”) ඔබට ලබා දෙනු ලැබේ. එහෙත් පසුව, එම සේවාවන් සඳහා වූ වියදම් ඔබ විසින් ආපසු ගෙවිය යුතුය.<br>හදිසි නොවන සියලුම වෛද්‍ය සේවාවන් සඳහා ඔබම වගකිය යුතු අතර, ඒවා ලබාගැනීමට<br>පෙර ගෙවිය යුතුය. | ලියකියවිළි අවශ්‍ය නොවේ, හදුනා ගැනීමේ බළපත්‍රය පෙන්වා අවශ්‍ය සේවාව ළබා ගන්න.<br><br> |
| වෛද්‍ය සත්කාර සඳහා නේවාසික අවසරපත්‍රයක් (Permesso di soggiorno per cure mediche) හිමි විදේශිකයකු පොලිස් සන්ක්‍රමණ කාර්‍යාලය(Questura) විසින් වෛද්‍ය සත්කාර සඳහා විසා (visto per cure mediche) ලබාගෙන ඉතාලියට වෛද්‍ය ප්‍රතිකාරයක්<br>සඳහා පිවිසීමට අවසර ලැබූ විදේශිකයකුට සහ අවශ්‍ය නම් ඔහුගේ අනුගමනයකරුට (accompagnatore) — අන්ක 36 (ex art. 36) අනුව මෙම නේවාසික අවසරපත්‍රය නිකුත් කරනු ලැබේ. | Ssn සඳහා ලියා පදින්චි විය නොහැක. | දින 8ක් තුළ කුවෙස්තුරා ආගමණ විගමණ පොළිස් කාර්‍යාලය මගින් ඉල්ලුම් කළයුතුය. |
| ආභාදිත තත්වය ඇති විදේශිකයන් | සිවිල් අභාදිත තත්වය පිළිගැනීම: සිවිල් අභාදිත තත්වය ඇති විදේශිකයකුට නැවතීමේ බළපත්‍රය වලන්ගු කාළය වසරකට වඩා ඇත්නම් ඉල්ලුම සළකා බැලේ. | සමාජ සුරක්ෂනණ ඉන්ජ්ස් ආයතනයෙන් ඉල්ලුම් කිරීම සඳහා ඉතාලි ජාතිකයනට මෙන් ලිපි ලේඛන අව්ශ්‍යවේ.<br><br> |

<table>
<tr>
<td>ඉතාලි පුරවැසියෙකුගේ විදෙස් ස්වාමියා හෝ භාර්යාව<br><br>ඉතාලි පුරවැසියෙකු සමග විවාහ වූ විදේශීකයකුහට විවාහය හේතුව මත නේවාසික අවසරපත්‍රයක් (permesso di soggiorno per motivi familiari) ඉල්ලුම් කළ හැක</td>
<td>සෞඛ්‍ය සේවා ලබාදීම ඔබේ තත්ත්වය මත වෙනස් වේ:<ul><li>ඔබ සතුව නේවාසික අවසරපත්‍රයක් (permesso di soggiorno) තිබේ නම්, එහි වර්ගය අනුව අදාල නිශ්චිත ක්‍රමවේදය අදාළ වේ (හෝ ඔබ එය බලාපොරොත්තු වන අවස්ථාවේදීම).</li><li>ඔබ සතුව ඉතාලි පුරවැසිභාවය (Decreto Ministeriale මගින් නිකුත් කළ පනත් අනුමැතිය) තිබේ නම්, ඉතාලි පුරවැසියන්ට අදාල එම ක්‍රමවේදයම ඔබට අදාළ වේ.</li><li>ඔබ සතුව නේවාසික අවසරපත්‍රයක් නැතිනම්, හෝ එය ඉල්ලීම් කර නොමැති නම්, ඔබට තාවකාලිකව ඉතාලියෙහි පදිංචි විදේශිකයන් සඳහා (STP) නියමිත ක්‍රමය අදාළ විය හැක —එනම්, ස්වයං-ප්‍රකාශිත දුප්පත්භාවය (indigenza autocertificata) පවතින අවස්ථාව.</li></ul></td>
<td>ඔබගේ විශේෂ තත්ත්වයට අදාලව අවශ්‍ය ලේඛන ඉදිරිපත් කරන්න.<br><br></td>
</tr>
</table>

# 3. නේවාසික අවසරපත්‍රයක් නොමැති විදේශිකයින්ගේ සෞඛ්‍ය අයිතිවාසිකම්

| තත්ත්වය | අයිතිවා සි කම් | අවශ්‍යදේ |
|---|---|---|
| STP සඳහා සෞඛ්‍ය සේවා තාවකාලිකව ඉතාලියෙහි පදිංචි විදේශිකයන් (STP) ආගමන නීති හෝ නේවාසික නීති අනුකූල නොවන ලෙස සිටින විදේශික පුද්ගලයන්ට (උදාහරණයක් ලෙස, නීතිවිරෝධීව පැමිණි / නීතිවිරෝධීව පදිංචි වූ) අදාළ වේ.<br><br>**වැදගත්:**<br>නීතිය අනුව, සෞඛ්‍ය සේවා නිලධාරීන්ට නීතිවිරෝධී විදේශිකයන් ගැන පොලිසියට හෝ අධිකාරීන්ට දැනුම් දීමට අවසර නැත.<br>එබැවින්, ඔබට භය නොමැතිව සෞඛ්‍ය සේවා ආයතන වෙත පිවිසීමට සහ ප්‍රතිකාර ලබා ගැනීමට හැක. | ඔබට SSN (ජාතික සෞඛ්‍ය පද්ධතිය) වෙත ලියාපදිංචි විය නොහැක, නමුත් ඔබට පහත සේවාවන් ලබා ගැනීමේ අයිතිය ඇත:<br>• හදිසි හෝ අත්‍යවශ්‍ය රෝහල් සහ බාහිර රෝගී සේවා (cure ambulatoriali e ospedaliere urgenti o essenziali)<br>• පූර්ව සෞඛ්‍ය සේවා (medicina preventiva)<br><br>එයට ඇතුළත් වන්නේ:<br>• ගර්භනී සහ මාතෘ සෞඛ්‍ය ආරක්ෂාව (ඇතුළුව නීතිමය ගබ්සා කිරීමේ ස්වෙච්ඡා ක්‍රියාව – IVG)<br>• දරුවාගේ සෞඛ්‍යය සුරක්ෂිත කිරීම<br>• අනිවාර්ය සහ නිර්දේශිත එන්නත් කිරීම<br>• ජාත්‍යන්තර පූර්ව ආරක්ෂණ ක්‍රියාපටිපාටි (profilassi internazionale)<br>• බෝවෙන රෝගවල රෝග හඳුනාගැනීම හා ප්‍රතිකාර පූර්වකාලීන ආරක්ෂාව.<br>• මත්පැන් සහ මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවූවන් මුදවා ගැනීමේ , රෝගවල නිරෝධායන, රෝග පරීක්ෂණ සහ ප්‍රතිකාර | ඔබ සම්බන්ධ විය යුතු ස්ථාන:<br><br>• ඉතා හදිසි ප්‍රතිකාර සඳහා: රෝහල් වල ඇති Pronto Soccorso (උපත්/ඉතා හදිසිසේවා ඒකක) වෙත යන්න<br>• වෛද්‍ය පරීක්ෂණ සඳහා: STP සඳහා විශේෂයෙන් නිර්දේශිත බාහිර රෝගී මධ්‍යස්ථාන (ambulatori dedicati STP) වෙත යන්න.<br>• විශේෂ තත්ත්වයන් සඳහා: දිස්ත්‍රික් සෞඛ්‍ය මධ්‍යස්ථාන (Distretto sanitario) වල නිදහස් ප්‍රවේශය ඇති සේවා මධ්‍යස්ථාන වෙත (වෛද්‍ය රෙසිපියක් අවශ්‍ය නොවේ), ජනතාවට විවෘත වන වේලාවන්හිදී යා හැක.<br><br> |
| තාවකාලික සෞඛ්‍ය කාඩ්පත (Tessera Sanitaria Provvisoria) නිකුත් කිරීම සහ අළුත් කිරීම තාවකාලිකව ඉතාලියෙහි පදිංචි විදේශිකයා (STP) එනම් , ආගමන නීති හෝ නේවාසික නීති අනුකූල නොවන ලෙස සිටින විදේශීකයකු (උදාහරණ ලෙස, නීතිවිරෝධීව පැමිණි හෝ නීතිවිරෝධීව පදිංචි වූ) යන්නයි. | STP කාඩ්පත සමඟ, ඔබට X01 කේතය සහිත ටිකට් වියදමින් (ticket) මිදීමේ අයිතිය ඇත.<br>(එය ඖෂධ සඳහා වලංගු නොවේ).<br>එසේම, රෝග තත්ත්වයන් සහ මාතෘභාවය සඳහා නියමිත අයකිරීම් වලින් මිදීම් ඔබට අදාළ වේ.<br>සටහනක්: 2017 සිට, ඉතාලියේ පදිංචි බාළ වයස්කාර දරුවනට SSN සඳහා ලියාපදිංචිවීමේ අයිතිය ලබා දී ඇත.<br><br> | දිස්ත්‍රික් සෞඛ්‍ය කාර්යාලයේ (Ufficio Anagrafe) "දුප්පත්භාව ප්‍රකාශය" (dichiarazione di indigenza) අත්සන් කළ යුතුය එනම් , ප්‍රතිකාර සඳහා අවශ්‍ය ආර්ථික සම්පත් නොමැති බව සහ දුප්පත් බව ස්වයංව ප්‍රකාශ කිරීමයි.<br>මෙය කළ පසු, ඔබට තාවකාලික සෞඛ්‍ය කාඩ්පත (Tessera Sanitaria Provvisoria – STP) ලබා ගත හැකි අතර එය මාස 6ක කාලයක් සඳහා වලංගු වේ.<br>ඔබ සතුව නේවාසික අවසරපත්‍රයක් නොමැති |

| | | |
|---|---|---|
| | | විදේශිකයකු වුවද, හැඳුනුම් ලේඛනයක් (උදාහරණයක් ලෙස පාස්පෝර්ට් එකක්, එය කල්ඉකුත් වුණත්) තිබේ නම්, ඔබට දිස්ත්‍රික් Ufficio Anagrafe වෙත යාමෙන් STP කාඩ්පත ලබා ගත හැක —<br><br>මෙහිදී හැඳුනුම් ලේඛනය පෙන්වා දුප්පත්භාව ප්‍රකාශය අත්සන් කළ යුතුය. කාඩ්පත නැවත නවීකරණය කිරීමේදී, නැවතත් එම කාර්යාලයට නව දුප්පත්භාව ප්‍රකාශයක් (dichiarazione di indigenza) ලබා දිය යුතුය, ඒ සඳහා හැඳුනුම් ලේඛනයක් නැති වුවද එය පිළිගත යුතුය. 2024 පෙබරවාරි 5 දින නිකුත් කළ අංක 0037517 යන නිවේදනය මගින්, සෞඛ්‍ය ආයතනය සෞඛ්‍ය සේවා ලබාගැනීමේ භූමි අයිතියට අනුව. |

## 4. ජාත්‍යන්තර ආරක්ෂාව

| තත්ත්වය | අයිතිවා සි කම් | අවශ්‍යදේ |
|---|---|---|
| දේශපාලන ආරක්ෂාව ඉල්ලා සිටින විදේශිකයෙකු. | ඔබට බදු අන්කයක් (Codice Fiscale) නොමැතිනම්, ඔබට ජාතික සෞඛ්‍ය සේවාව (SSN) හි ලියාපදිංචි විය නොහැක. ඔබට සෞඛ්‍ය සේවාවක් අවශ්‍ය නම්, ඔබ සවුක්‍ය සේවා කායීාලයෙන් උපකාර ලබා ගෙන STP සේවය ඉල්ලා සිටින්න. | ඔබේ තත්ත්වය STP (තාවකාලිකව පැමිණි විදේශිකයෙකු) යන ලෙස සැලකිල්ලට ගෙන ක්‍රියාත්මක වන්න.<br><br> |
| අන්තර්ජාතික ආරක්ෂාව සඳහා ආශ්‍රිත ඉල්ලීම නිළ වශයෙන් ඉදිරිපත් කර ඇති විදේශිකයකු | සෞඛ්‍ය සේවා ප්‍රාදේශීය පද්ධතිය (SSR) හි ලියාපදිංචිය උපරිම මාස 6 ක කාලයක් සඳහා නිකුත් කෙරේ. නැවතීමේ බළපත්‍රය නිකුත් කිරීම ප්‍රමාද වූ විට, එය තවත් මාස 3 ක කාලයක් සඳහා නැවත දිගු කළ හැක, නිකුත් කිරීම සිදු වන තෙක් (2018.06.11 දිනට අදාළ 372901 ප්‍රාදේශීය චක්‍රලේඛය අනුව).<br><br>සටහන: ලියාපදිංචි කිරීමක් හෝ නැවත ලියාපදිංචියක් ඉල්ලා සිටින විට, ජනගණනා කාර්යාල (Ufficio Anagrafe) හි නිලධාරීන්, අයදුම්කරුගේ Codice Fiscale | C3 ආකෘති පත්‍රයේ පිටපතක්. නවාතැන් මධ්‍යස්ථානයේ (Centro di Accoglienza) භාරකාරවා විසින් නිකුත් කරන නවාතැන් සහතිකය — එය ස්ථිර ලිපිනය සඳහා වෙනුවට භාවිතා වේ. |

| | | |
|---|---|---|
| | (CF) අංකය TS පද්ධතියේ (Tessera Sanitaria system) පවතින බව පරීක්ෂා කළ යුතුය. | |
| මෙයින් අදහස් කරන්නේඑම පුද්ගලයා දේශපාලන රැකවරන හෝ (asilo politico) හෝ අන්තර්ජාතික ආරක්ෂාව (protezione internazionale) සඳහා ඉල්ලීමක් දී ඇති බවත්, එය නිල වශයෙන් ලියාපදිංචි (formalizzata) කර ඇති බවත්ය. | ඔබට අත්‍යවශ්‍ය ජාතික සෞඛ්‍ය සේවාව (SSN) වෙත (නොමිලයේ) ලියාපදිංචි වීමේ අයිතිය ඇත. එහි වලංගුකාලය ඔබේ නැවතීමේ අවසරපත්‍රයේ කාලසීමාවට සමාන වන අතර, අලුත් කිරීමේ ක්‍රමයත් අනෙකුත් අවසරපත්‍ර වර්ග වලට සමාන වේ.<br><br>ඔබට මාස 6 ක කාලය තුළ පමණක් E07 කේතය සමඟ ටිකට් ගාස්තු සමගින් වියදම අය නොකෙරෙන අයිතිය ඇත.<br><br>සටහන: තාවකාලික ආරක්ෂාවක් ලබාගත් යුක්‍රේන පුරවැසියන්ට නිකුත් කළ රැකවරණ අවසරපත්‍ර, 2024 දෙසැම්බර් 31 දින කල් ඉකුත් වන පසු, අයදුම්කරුගේ ඉල්ලීම මත, 2026 මාර්තු දක්වා නැවත දිගු කළ හැක, යුරෝපා සංගම ක්‍රියාත්මක කිරීමේ තීරණය 2024/1836 අනුව (DL 202, 27 දෙසැම්බර් 2024, අංශ 2, උපඅංශ 2 අනුව). තාවකාලික ආරක්ෂාව යටතේ රැකවරණ අවසරපත්‍ර හිමියන් සඳහා ලබාදෙන ආධාර හා සෞඛ්‍ය සහන වැඩසටහන් 2025 දෙසැම්බර් 31 දක්වා දිගු කර ඇත (DL 202, 27 දෙසැම්බර් 2024, අන්ක 20 අනුව). | • තැන්පත් අවසරපත්‍රය (Permesso di soggiorno) හෝ එයට අදාල ලැබුණු රිසිට් පත එම පත්‍රයේ තේරුම් ගත හැකි ලෙස "Codice Fiscale" අංකය සඳහන් විය යුතුය.<br>• නවාතැන් මධ්‍යස්ථානයේ (Centro di Accoglienza) නවාතැන් සහතිකය — (නිවාස ලියාපදිංචිය සඳහා<br><br>බලාපොරොත්තු වන කාලය තුළ) —<br>හෝ නවාතැන් ලිපිනය (එය පොලිස් කාර්යාලයට — Questura — සපයා ඇති තාවකාලික ලිපිනයට සමාන වන අතර, ස්වයං-සහතික කළ හැක). |
| දේශපාලන රැකවණ ඉල්ලීම සඳහා නිකුත් කළ රැඳී සිටීමේ බලපත්‍රයක් (permesso di soggiorno) ලබා ඇති විදේශිකයෙකු: එම පුද්ගලයා දේශපාලන රැකවණ (asilo) සඳහා ඉල්ලීමක් කර සහ ඒ සඳහා ඉටු කිරීම් ක්‍රියාවලිය මත රැඳී සිටීමේ බලපත්‍රයක් (Permesso di soggiorno per richiesta asilo) ලබා ඇතිවිට. | ඔබට නොමිලේ, අනිවාර්ය ලෙස ජාතික සෞඛ්‍ය සේවාව (SSN) වෙත ලියාපදිංචි වීමේ අයිතිය ඇත.<br><br>පළමු වතාවේදී එය මාස 6 ක කාලයක් සඳහා වලංගු වන අතර, පසුව අලුත් කිරීමේදී සෑම වතාවකම මාස 3 ක කාලයක් සඳහා වලංගු වේ. | • ප්‍රතික්ෂේප තීරණයක් (diniego) එරෙහිව අධිකරණයට ඉදිරිපත් කරන ලද අභියාචනයේ ලියාපදිංචි (ප්‍රොටොකෝල් කළ) පිටපතක්.<br>• Codice Fiscale (පෞද්ගලික බදු අංකය / හැඳුනුම් අංකය). |
| නේවාසික අවසරය පත ප්‍රතික්ෂේප කර ඇති විට, එම ප්‍රතික්ෂේප තීරණයට එරෙහිව අධිකරණයට අභියාචනාවක් ඉදිරිපත් කර ඇති විට.<br><br>සටහන: එහෙත්, එසේ වුවද නව ඉල්ලීමක් (නව බලපත්‍රය සඳහා) ඉදිරිපත් කළ යුතුය. | ඔබට SSN වෙත අනිවාර්ය (නොමිලේ) ලියාපදිංචි වීමට අයිතිය ඇත,<br>ඒ සඳහා වලංගු කාලයත් නැවත අලුත්කරනා ක්‍රමවේදත් අනෙක් සියලු soggiorno අවසර වර්ග වලට සමාන වේ.<br><br>විශේෂ සේවා (prestazioni specialistiche) සඳහා — ඔබට විශේෂ මූලික ආරක්ෂාවන් (esenzioni) හිමිකම් නොමැතිනම් —<br>ඉතාලි පුරවැසියන් සේම ඔබද ticket ගෙවීම සඳහා බද්ධ වෙයි | • පෙර්මෙස්සොදි සොජ්ජෝර්නො<br>• කෝඩිචි පිස්කාලෙ<br>• පදිංචි ස්ථානය සම්බන්ධ ලියවිල්ල |

## 5. ගර්භණී සහ ප්‍රසව විදේශීය කාන්තාවන් සඳහා

| තත්ත්වය | අයිතිවාසිකම් | අවශ්‍යදේ |
|---|---|---|
| ගර්භණී සහ ප්‍රසව කාන්තාවන් සඳහා නිකුත් කරන පදිංචි අවසරපත්‍රය<br><br>D.P.R. 394/1999, අංශ 28 අනුව ගර්භණී හෝ ප්‍රසව සුවය ලැබූ කාන්තාවන්ට වෛද්‍ය සායනයකින් නිකුත් කරන සෞඛ්‍ය සහතිකයක් ඉදිරිපත් කිරීමෙන් පසු උපරිම මාස 6ක් සඳහා වෛද්‍ය ප්‍රතිකාර සඳහා පදිංචි අවසරපත්‍රයක් ලබා දිය හැක.<br>මෙම පදිංචි අවසරපත්‍රය "ප්‍රතිකාර සඳහා" යන හේතුව සඳහන් කර තිබුණද, වශයෙන් එය මානුෂීය ආරක්ෂාවක් (asilo umanitario) හෝ විශේෂ ආරක්ෂාවක් (Protezione speciale) ලෙස සැලකිය යුතුද? | ඔබ දරුවෙකු බලාපොරොත්තු වන අතර වෛද්‍ය ප්‍රතිකාර සඳහා නිකුත් කළ පදිංචි අවසරපත්‍රයක් ඔබට තිබේ නම්:<br><br>ඔබට ජාතික සෞඛ්‍ය සේවා පද්ධතිය (SSN) වෙත නොමිලේ හා අනිවාර්ය ලෙස ලියාපදිංචි වීමට අයිතිය ඇත.<br>මෙම ලියාපදිංචිය ඔබේ දරුවාට මාස 6ක් පිරෙන තෙක් වලංගු වන අතර, දරුවාටද එම ලියාපදිංචි අයිතිය ඇත.<br>ඔබට SSN වෙත අනිවාර්ය ලියාපදිංචියෙන් ලබාදෙන සෞඛ්‍ය සේවා සියල්ලටම අයිතිය ඇත, ඒ අතර ගර්භනී කාලයේදී සහ ප්‍රසව කාලයේදී ලබාදෙන නොමිලේ පරීක්ෂා සහ ප්‍රතිකාරද ඉතාලි පුරවැසියන්ට හිමි අයිතිවලට සමාන ලෙස ඇතුළත් වේ. | ඔබ පදිංචි වන සෞඛ්‍ය දිස්ත්‍රික්කයේ නියෝජිත ලියාපදිංචි කාර්යාලයට (Ufficio anagrafe assistiti) ඔබේ පදිංචි අවසරපත්‍රය (Permesso di soggiorno) ඉදිරිපත් කළ යුතුය.<br><br><br><br>තවද, Codice Fiscale (බදු අංකය / හැඳුනුම් අංකය) තිබීම අනිවාර්ය වේ. |

| | | |
|---|---|---|
| පදිංචි අවසරපත්‍රයක් නොමැති ගර්භණී කාන්තාවක්<br>පදිංචිය හෝ ප්‍රවේශය පිළිබඳ නීතිවලට අනුකූල නොවන (රහසිගතව පැමිණි) හෝ අක්‍රමික ලෙස පදිංචි වූ ගර්භණී විදේශියක කාන්තාවක් යනු, දරුවෙකු බලාපොරොත්තු වන කාන්තාවකි.<br><br>වැදගත්ය: දරුවාට මව පිළිබඳ නිශ්චිත හඳුනාගැනීමේ අයිතිය ප්‍රමුඛ බව නිසා, පදිංචි අවසරපත්‍රයක් නොමැති විදේශීය ගර්භණී කාන්තාව, වලංගු හැඳුනුම්පතක් (documento di identità valido) අත්පත් කර තිබිය යුතුය. ඔබට වලංගු හැඳුනුම්පතක් නොමැති අතර, ඔබගේ දරුවාට මාතෘත්වය ලැබීමට ප්‍රථම අවශ්‍ය නම්, ඔබට ගර්භණී අවස්ථාවේදීම (ප්‍රසූති රෝහලට ඇතුල්වීමට පෙර) වෛද්‍ය ප්‍රතිකාර සඳහා පදිංචි අවසරපත්‍රයක් ලබා ගැනීමට ඉල්ලීම් කළ හැක | STP ක්‍රියාවලිය (Straniero Temporaneamente Presente) මගින්, ඔබට ගර්භනී කාලය හා ප්‍රසව කාලය තුළ ලබාදෙන සියලු නොමිලේ පරීක්ෂා සහ ප්‍රතිකාර ලබාගැනීමට ඉතාලි පුරවැසියන්ට හිමි අයිතිවලට සමාන ලෙස  අයිතිය ඇත. | STP ක්‍රියාවලිය යටතේ වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට, ඔබ පදිංචි වන සෞඛ්‍ය දිස්ත්‍රික්කයේ (Distretto Sanitario) ආයතන වෙත සම්බන්ධ විය යුතුය.<br><br>විශේෂයෙන්:<br>• හදිසි ප්‍රතිකාර සහ ප්‍රසූතිය සඳහා: රෝහල් හදිසි ප්‍රතිකාර ඒකක සහ නාරි සහ ප්‍රසව රෝහල් (Pronto Soccorso) වෙත යා යුතුය.<br>• වෛද්‍ය පරීක්ෂණ සඳහා: ඔබ පදිංචි (තාවකාලික) සෞඛ්‍ය දිස්ත්‍රික්කයේ STP සඳහා නියමිත විශේෂ<br>• නියමිත හෙද මධ්‍යස්ථානය (Ambulatorio Dedicato agli STP) වෙත යා යුතුය. |

## 6. විදේශීය දරුවන්ගේ සවුක්‍ය සහ සුරක්ෂිත තාවය

| තත්ත්වය | අයිතිවාසිකම් | අවශ්‍යදේ |
|---|---|---|
| ඉතාලියේදී උපන් දරුවාගේ එක මව්පියෙකුට හෝ අඩුතරමින් පදිංචි අවසරපත්‍රයක් තිබෙන විට, ජාතික සෞඛ්‍ය සේවා පද්ධතිය (SSN) වෙත අනිවාර්ය ලියාපදිංචි වීමේ අයිතිය ලැබේ. | SSN වෙත අනිවාර්ය ලියාපදිංචිය මෙම ලියාපදිංචිය මව්පියන්ගේ පදිංචි අවසරපත්‍රයේ කල් ඉකුත් වන දිනයට සමාන වේ.<br>දරුවාට ඉතාලි පුරවැසිත්වය ලැබෙන්නේ නැත. | අළුත උපන් දරුවාට SSN වෙත ලියාපදිංචි වීමට, සෞඛ්‍ය දිස්ත්‍රික්කයේ ලියාපදිංචි කාර්යාලයට (Ufficio anagrafe del Distretto Sanitario) පහත ලේඛන ඉදිරිපත් කළ යුතුය:<br>• උප්පැන්න සහතිකය ( නගර සභාව මඟින් නිකුත් කළ)<br>• Codice Fiscale (බදු හැඳුනුම් අංකය)<br>• දරුවාගේ නම සඳහන් වූ ගමන් බලපත්‍රය (පාස්පෝර්ට්)<br>*(හෝ, මව්රටේ තානාපති කොන්සොලාතෝ නියෝජිත කාර්යාලය මඟින් නිකුත් කළ දරුවාගේ හැඳුනුම් සහතිකය)* |

| | | |
|---|---|---|
| පදිංචි අවසරපත්‍ර නොමැති විදේශීය මව්පියන් සමඟ | 2017 ජනවාරි 12 දින නිකුත් කළ DPCM තුළ සඳහන් LEA (Livelli Essenziali di Assistenza) නියමයන් සහ 47/2017 නීතිය අනුව,<br>ඉතාලියේ පදිංචි නීති හා ප්‍රවේශ නීති අනුගමනය නොකර සිටින විදේශීය බාළවයස් කාරදරුවන් සහ MSNA (Minori Stranieri Non Accompagnati – භාර කරුවකු නොමැති විදේශීය දරුවන්)<br>ජාතික සෞඛ්‍ය සේවා පද්ධතිය (SSN) වෙත නොමිලේ සහ අනිවාර්ය ලියාපදිංචියට අයිතියක් ඇත,<br>ඒ සමඟම ඔවුන්ට PLS (Pediatra di Libera Scelta – තෝරූ ළමා විශේෂඥ වෛද්‍යවරයෙකු නියතව ලැබේ. | SSN වෙත ලියාපදිංචි වීමට,<br>*ඔබ* සෞඛ්‍ය දිස්ත්‍රික්කයේ ලියාපදිංචි කාර්යාලවලට (Uffici Anagrafe dei Distretti Sanitari) *පැමිණිය යුතුය*.<br>Codice Fiscale (CF) *නිකුත් කිරීම සඳහා අවශ්‍ය පරීක්ෂණ හා ක්‍රියාවලිය* සම්බන්ධ කාර්යාලය විසින් *සිදු කරනු ලැබේ*.<br>2024 ජනවාරි 12 දින නිකුත් කළ සටහන 0012910 සහ 2025 මැයි 6 දින නිකුත් කළ සටහන 0149352 මගින්,<br>ආයතනය පෙන්වා දී ඇත්තේ ආගමන සහ පදිංචි නීති අනුගමනය නොකර සිටින විදේශීය බාළවයස්කාර දරුවන්ට සහ භාර කරුබවකු නොමැති බාළවයස්කාර ළමයින්ට Codice Fiscale නිකුත් කිරීමේදී නියමයන් සමාන ලෙස හා ඒකාකාරව ක්‍රියාත්මක කළ යුතු බව වේ. |
| දරුකමට හදා ගන්නා හෝ භාරකාරත්වයට පත්කර ඇති විදේශීය දරුවකු. | SSN වෙත අනිවාර්ය ලියාපදිංචිය මෙ සඳහා පදිංචි අවසරපත්‍රයක් අවශ්‍ය නොවේ. | SSN වෙත ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය ලේඛන:<br>• බාළවයස්කාර ළමයාගේ ගමන් බලපත්‍රය<br>• බාළවයස්කාර ළමයාගේ Codice Fiscale බදු හැඳුනුම් අංකය<br>• මව්පියන්ගෙන් කෙනෙකුගේ හැඳුනුම්පත<br>• පවුල් තත්ත්වය පිළිබඳ සහතිකය (autocertificabile – ස්වයං ප්‍රකාශයකින් සනාථ කළ හැක)<br>• අන්තර්ජාතික දත්ත සභාව (Commissione Adozioni Internazionali) මගින් නිකුත් කරන ඉතාලියට ප්‍රවේශ වීමට අවසර ලේඛනය |

## 7. ටිකට් පත ගෙවීමෙන් නිදහස් විම

| තත්ත්වය | අයිතිවාසිකම් | අවශ්‍යදේ |
|---|---|---|
| ටිකට් පත ගෙවීමෙන් නිදහස් විම | • ඔබ SSN වෙත නීත්‍යානුකූල ලෙස ලියාපදිංචි වූ විදේශිකයෙකු නම්, ඔබට ඉතාලි පුරවැසියන්ට සමාන ලෙස පහත සෞඛ්‍ය සේවා නොමිලේ ලබා ගැනීමේ (ticket esenzione) අයිතිය ඇත: ආදායම අඩු වීම රැකියාව නොමැති වීම විශේෂ තත්ත්වයන් (උදා: ගර්භණී කාන්තාවක් වීම හෝ විශේෂ රෝග තත්ත්වයක් තිබීම)<br><br>• ඔබ STP ක්‍රියාවලිය යටතේ (Straniero Temporaneamente Presente) සේවා ලබන විදේශිකයෙක් නම්, ඔබට X01 අංකයෙන් හඳුන්වන ticket esenzione අයිතිය ඇත (ඒත් එය ඖෂධ සඳහා වලංගු නොවේ). ඔබට ආදායම මත පදනම් වූ රෝග සම්බන්ධ esenzione ලබාගැනීමට අයිතිය නොමැත<br><br>• ඔබ රැකවරණ ඉල්ලුම්කරුවකු නම් (permesso per richiesta di asilo), ඔබට E07 අංකයෙන් හැඳින්වෙන ticket esenzione අයිතිය පළමු මාස 6කදී පමණක් හිමි වේ.<br><br>• තාවකාලික ආරක්ෂාව ලැබූ උක්රේන පුරවැසියන්ට X22 අංකයෙන් හැඳින්වෙන සහන ticket esenzione අයිතිය ඇත. | සෞඛ්‍ය කාඩ්පත නිකුත් කරන විට ස්වයංක්‍රීයව X01, E07 සහ X22 ආරක්ෂණ කේත (codici di esenzione) ලබා දේ (මෙම කේත කාඩ්පතේද සඳහන් වේ).<br><br>වෙනත් ආරක්ෂණ සඳහා (රෝග විශේෂ, ආදායම් මට්ටම්, ආදිය) ප්‍රවේශය ලැබීමට, ඉතාලි පුරවැසියන් සේම, ඔබ විසින් අවශ්‍ය ලේඛන ඉදිරිපත් කළ යුතුය. |

## 8. යුරෝපීය සන්ගම් ජාතිකයනගේ සවුක්‍ය අයිතිවාසිකම්

| තත්ත්වය | අයිතිවාසිකම් | අවශ්‍යදේ |
|---|---|---|
| ඉතාලියේ පදිංචි වීම සඳහා අවශ්‍ය සුදුසුකම් නොමැති, යුරෝපීය සංගමයේ (EU) පුරවැසියෙකු වන දුප්පත් පුද්ගලයෙකු (Tessera Europea di Assistenza Medica – TEAM පත්‍රයද නොමැති අයෙකු). | ඔබට SSN වෙත ලියාපදිංචි වීමට හැකියාව නොමැත. ඔබට SSN වෙත ලියාපදිංචි වීමට හැකියාව නොමැත. ඉතාලියට පැමිණීමෙන් මාස 3ක් පසු, ඔබට ENI ක්‍රියාවලිය (Europeo Non Iscritto) යටතේ ලියාපදින්චි නොවිය හැකි, හදිසි හා අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවා ලබා ගැනීමට හැකියාව ඇත. ඒ සේවාවලට ඇතුළත් වේ:<br>● බාළ වයස්කාර ළමයින්යින්ගේ සෞඛ්‍ය සුරක්ෂිතතාවය<br>● මාතෘ ආරක්ෂාව<br>● ගර්භනී තත්වය ස්වෙච්ඡාවෙන් නවතා දැමීම නීතිමය ගබ්සා (IVG)<br>● එන්නත් ව්‍යාපෘති සහ ජාත්‍යන්තර ආරක්ෂක ක්‍රියාමාර්ග<br>● රෝග නිරෝගීකරණය (ආසාදන රෝග) වැළැක්වීම, රෝග නිර්ණය සහ ප්‍රතිකාර<br>● මත්පැන් හා මත්ද්‍රව්‍ය ඇබ්බැහි වීම සහ ආශ්‍රිතතා වැළැක්වීම, නිරීක්ෂණය සහ ප්‍රතිකාර<br><br>ඔබට ticket esenzione (නොමිලේ සේවා අයිතිය) හිමි වන්නේ රෝග හෝ ගර්භනී තත්ත්වයක් සඳහා පමණි. | අවශ්‍යය වන දේ:<br>● වලංගු හැඳුනුම්පතක් තිබිය යුතුය. SSN වෙත ලියාපදිංචි වීමට අවශ්‍ය සුදුසුකම් නොමැති බව සඳහන් කරන<br>● ප්‍රතිස්ථාපන දිවුරුම් ප්‍රකාශ පතක් (dichiarazione sostitutiva di certificazione) අත්සන් කළ යුතුය.<br><br>ENI ක්‍රියාවලිය (Europeo Non Iscritto) ක්‍රියාත්මක කරනු ලබන්නේ STP සඳහා නියමිත හෙද / සායණ මධ්‍යස්ථානවල (Ambulatori Dedicati agli STP), පවුල් උපදේශන මධ්‍යස්ථානවල (Consultori Familiari) සහ සෞඛ්‍ය දිස්ත්‍රික්කවල එන්නත් මධ්‍යස්ථානවල (Centri Vaccinali dei Distretti Sanitari) ය. |

# I 27 යුරෝපා සන්ගම් සාමාජිකයන්



# නියමිත එස් ටී පී / ඒනි වෛයිද්‍ය සායණ

| සවුඛ්‍ය වසම | සවුඛ්‍ය ලියාපදින්චි කාර්යාලය | නියමිත එස් ටී පී ඒනි වෛද්‍ය සායණ |
|---|---|---|
| **24** | C.so Vittorio Emanuele, 690<br>081.2547117<br><br>අඟහරුවාදා – බදාදා<br>08:30 – 13:00<br><br>*ufficioanagrafe.ds24@aslnapoli1centro.it* | Via Michelangelo Schipa, 9<br>(ex P.O. Loreto Crispi)<br><br>සඳුදා:15:00 – 19:00<br>බදාදා: 15:00 – 19:00 |
| **25** | Via Davide Winspeare 67<br>081.2548154<br><br>සඳුදා සිට සිකුරාදා දක්වා<br>08:30 – 11:30<br><br>*ufficioanagrafe.ds25@aslnapoli1centro.it* | Via Winspeare, 67<br>0812548206<br><br>සිකුරාදා: 14:30 – 18:00 |
| **26** | Via Canonico Scherillo, 12<br><br>සඳුදා - බදාදා - සිකුරාදා<br>08:30 – 13:00<br><br>*ufficioanagrafe.ds26@aslnapoli1centro.it* | Via C. Scherillo, 12<br><br>බදාදා: 14:00 – 19:00<br>සිකුරාදා: 14:00 – 19:00 |
| **27** | Via San Gennaro ad Antignano, 42<br><br>සඳුදා සිට සිකුරාදා දක්වා<br>08:30 – 13:30<br><br>*ufficioanagrafe.ds27@aslnapoli1centro.it* | Via S. Gennaro ad Antignano, 42<br><br>තාවකාලිකව වසා ඇත |
| **28** | V.le della Resistenza, 25<br>081.2546523<br><br>සඳුදා – බදාදා: 08:30 – 13:00<br><br>*ufficioanagrafe.ds28@aslnapoli1centro.it* | V.le della Resistenza, 25<br>0812546591-6501<br><br>සඳුදා – බදාදා: 09:00- 12:30<br>බ්‍රහස්පතින්දා: 13:00 – 16:30 |
| **29** | C.so A.medeo di Savoia, 220<br><br>සඳුදා – බදාදා: 09:00 – 12:00<br><br>*anagrafe.ds29@aslanapoli1centro.it* | Via San Gennaro dei Poveri, 25 – c/o ex P.O. S. Gennaro<br>0812545886<br><br>සඳුදා: 14:00 – 19:00<br>අඟහරුවාදා: 8:30 – 13:30<br>බදාදා: 09:00 – 14:00<br>සිකුරාදා: 8:30 – 12:30<br><br>සින්හළ භාෂාමය සහ සන්ස්තික මැදිහත්කරු |

| | | |
|---|---|---|
| **30** | Presidio "S. Bellone" – piazzetta del Casale di Secondigliano, 22<br>081.254697<br><br>අඟහරුවාදා - බ්‍රහස්පතින්දා:<br>08:30 – 12:30<br><br>*ufficioanagrafe.ds30@aslnapoli1centro.it* | Via V. Valente, 4 (1° piano)<br><br>අඟහරුවාදා: 8:30 – 12:30<br>බදාදා: 8:30 – 12:30 |
| **31** | Via A. Vespucci,9<br>081.2542257-58<br><br>සඳුදා සිට බ්‍රහස්පතින්දා දක්වා<br>08:30 – 12:00<br><br>*ufficioanagrafe.ds31@aslnapoli1centro.it* | Via Egiziaca a Forcella, 18 c/o ex P.O. Annunziata<br><br>0812542603<br><br>සඳුදා: 12:30 – 16:30<br>අඟහරුවාදා: 12:30 – 16:30<br>බදාදා: 9:00 – 13:00<br><br>රුසියන් උක්‍රේන් භාෂාමය සහ සන්ස්තික මැදිහත්කරු |
| **32** | Via Fratelli Grimm, 178<br><br>081.2544332<br>සඳුදා – බදාදා - බ්‍රහස්පතින්දා<br>08:30 - 12:30<br><br>*ufficioanagrafe.ds32@aslnapoli1centro.it* | Via Fratelli Grimm, 178<br><br>0812544352<br><br>සඳුදා – අඟහරුවාදා – බදාදා – බ්‍රහස්පතින්දා<br>dalle 08:30 alle 12:30 |
| **33** | Piazza Nazionale, 95<br>081.2544504 - 4819<br><br>සඳුදා – අඟහරුවාදා - බ්‍රහස්පතින්දා<br>08:30 - 13:00<br><br>*ufficioanagrafe.ds33@aslnapoli1centro.it* | Piazza Nazionale 95 (piano terra)<br><br>0812549185-2343<br><br>සඳුදා: 14:30 – 19:30<br>අඟහරුවාදා: 14:30 – 18:30<br>බදාදා: 14:00 – 19:00<br>බ්‍රහස්පතින්දා: 14:00 18:00<br><br>ඉන්ග්‍රීසි ප්‍රන්ශ, අරාබි භාෂාමය සහ සන්ස්තික මැදිහත්කරු |

# මද්‍ය නාපොලි 1 වයිද්‍ය දිස්තික්ක කළාප




| දිස්තික්කය DSB | වසම QUARTIERI | වසම MUNICIPALITA’ |
|---|---|---|
| **24** | San Ferdinando, Chiaia, Posillipo | 1 |
| **25** | Bagnoli, Fuorigrotta | 10 |
| **26** | Soccavo, Pianura | 9 |
| **27** | Vomero, Arenella | 5 |
| **28** | Chiaiano, Piscinola-Marianella, Scampia | 8 |
| **29** | Stella, San Carlo all’Arena | 3 |
| **30** | Miano, Secondigliano, San Pietro a Patierno | 7 |
| **31** | Avvocata, Montecalvario, S. Giuseppe, Porto, Mercato, Pendino | 2 |
| **32** | Barra, San Giovanni a Teduccio, Ponticelli | 6 |
| **33** | Poggioreale, Zona Industriale, San Lorenzo, Vicaria | 4 |

## හදිසි අණතුරු සහ හදිසි රෝගී තත්ව සඳහා රෝහල්

| පළාත | රෝහල් **ASL Napoli 1 Centro** | ලිපිණය |
|---|---|---|
| ***Pignasecca*** | **Pellegrini** | Via Portamedina, 41 |
| ***Fuorigrotta*** | **San Paolo** | Via Terracina, 219 |
| ***Ponticelli*** | **Ospedale del Mare** | Via Enrico Russo |
| ***San Carlo all'Arena*** | **San Giovanni Bosco** | Via F. M. Briganti, 255 |
| ***Mercato*** | **Santa Maria di Loreto Nuovo** | Via Amerigo Vespucci, 15 |

| පළාත | වෙනත් හදිසි අවස්ථා රෝහල් පරිශ්‍රයන් **Città Di Napoli** | ලිපිණය |
|---|---|---|
| ***Vomero alto*** | **AZIENDA OSPEDALIERA "A. Cardarelli"** | Via A. Cardarelli, 9 |
| ***Vomero alto*** | **OSPEDALE "D. COTUGNO"** (solo malattie infettive) | Via G. Quagliariello, 54 |
| ***Vomero alto*** | **AZIENDA UNIVERSITARIA "Federico II"** (solo ostetrico) | Via Pansini 5 – edificio 9 |
| ***Vomero*** | **OSPEDALE "SANTOBONO"** (solo per bambini) | Via Mario Fiore 6 |
| ***Posillipo*** | **OSPEDALE "B.C. FATEBENEFRATELLI"** | Via Manzoni 220 |
| ***Ponticelli*** | **OSPEDALE EVANGELICO "VILLA BETANIA"** | Via Argine 604 |